**මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාවේ - 2022**
**------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.1 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු රු.29,278,134ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | අඩුවෙන් දක්වා තිබූ වටිනාකම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට නියමිත ආදායම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂ අවසාන දිනට පැවැති ගබඩා තොග රු.895,941ක් සහ ආයුර්වේද ඖෂධ තොග ශේෂය රු.866,860ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ගබඩා තොගය වත්කම් ලෙස එකතු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | තොග ශේෂ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස අනාවරණය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.51,150ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට නියමිත ආදායම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළයුතුය. |
| (ඈ) | සභාවට අයත් පුස්තකාල 11කට සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබූ රු.372,213ක පොත් 1,632ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | -එම- | පරිත්‍යාග ලෙස ලැබුණු පොත්, මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස අනාවරණය කළ යුතුය. |
| (ඉ) | සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ පැවැති වටිනාකම සඳහන් නොවූ ස්ථාවර වත්කම් 31ක්, රු.68,012ක් වටිනා කාබනික පොහොර ඇසුරුම් ද්‍රව්‍ය සහ රු.149,700ක කාබනික පොහොර තොග මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ වත්කම් ලෙස එකතු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | වත්කම් සහ තොග මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.26,037,993 ක් වටිනා ගිණුම් ශේෂ 09 ක් හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය, අත්තිකාරම් ලේඛනය, ශේෂ සනාථ කිරීම් සහ අයිතිය සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉඩම් හා ගොඩනැගිලි, පිරියත, මෝටර් රථ හා වාහන වැනි ස්ථාවර වත්කම් සහ හිඟහිටි ශේෂවල තොරතුරු රැස්කර ලේඛනවල ලේඛනගත කිරිමටත් පියවර ගෙන ඇති බව. | වත්කම්වලට අදාල ලිපිලේඛන රැස්කර ලෙජරයේ ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2) | සභාව විසින් පසුගිය වර්ෂ 10ක කාලපරිච්ඡේදය තුළ ලබාදුන් අත්තිකාරම් රු.1,335,076ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | විස්තර නොමැති අත්තිකාරම් ගැලපීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ උපදෙස් ඉල්ලා ඇති බව. | අත්තිකාරම් ගෙවීම්, ආපසු අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,605,386 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,125,623 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල්කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල්කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| i) | වරිපනම් හා බදු | 3,050,000 | 7,342,800 | 6,689,430 | 3,157,670 | 2,550,000 | 5,709,310 | 4,518,360 | 2,504,300 |
| ii) | කුලී | 17,737,000 | 9,085,657 | 17,491,824 | 6,919,645 | 17,737,000 | 20,423,972 | 5,827,642 | 15,325,812 |
| iii) | බලපත්‍ර ගාස්තු | 1,825,000 | 2,591,510 | 2,591,510 | -- | 1,200,000 | 2,000,960 | 2,000,960 | -- |
| iv) | වෙනත් ආදායම් | 43,610,000 | 55,040,481 | 55,040,803 | 5,005,689 | 83,410,000 | 56,361,682 | 56,966,419 | 5,006,011 |
| | | 66,222,000 | 74,060,448 | 81,813,567 | 15,083,004 | 104,897,000 | 84,495,924 | 69,313,381 | 22,836,123 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ සියළුම ආදායම් රැස්කිරීම්වල කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සන්නිවේදන කුළුණු සඳහා ව්‍යාපාර බදු රු.60,000ක් පසුගිය 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හිඟහිටිව පැවතුණි. | ව්‍යාපාර බදු හිඟමුදල් ගෙවීම පැහැර හරින ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | සන්නිවේදන කුළුණු සඳහා ව්‍යාපාර බදු අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ii) | සභා බලප්‍රදේශයේ ක්‍රියාත්මක වන සිනමාශාලා වලින් 2019 වර්ෂයේ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විනෝද බදු හිඟමුදල් රු.200,000ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | සිනමාශාලා සඳහා විනෝද බදු මුදල් ගෙවන ලෙසට ලිපි යවා ඇත. එසේම, ගෙවීමට අපොහොසත් වූ විට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟහිටි විනෝද බදු අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා පැවැති හිඟහිටි කඩකුලී රු.8,504,005ක් විය. | හිඟහිටිවලින් රු.216,750ක් අයකර ගෙන ඇත. ඉතිරි හිඟහිටි අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | හිඟහිටි කුලී අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ii) | 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා පැවැති හිඟහිටි බදුකුලී රු.6,985,055ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1985-2009කාල පරිච්ඡේදයේ රටෙහි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් අයකර නොතිබුණි. එමනිසා මේ පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියාට වාර්තා කර කපාහැරීමට පියවර ගෙන ඇති බව. | හිඟහිටි බදුකුලී අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| **(ඇ)** | **මුද්දර ගාස්තු හා උසාවි දඩ ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.4,498,191ක් විය. | 2023 වර්ෂයේ අයකර ගැනීමට පියවර ගන්නා බව. | හිඟහිටි මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බැංකු ජංගම ගිණුමේ සෑම මාසයක් අවසාන දිනට රු. මිලියන 24 සිට 34ක් අතර ප්‍රමාණයක මුදල් අතැති ශේෂ පැවැති අතර එම මුදල් බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර පොලී ආදායම් ඉපැයීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සභාවට සමාලෝචිත වර්ෂයේ ආසන්න වශයෙන් රු. මිලියන 1.5ක ආදායමක් අහිමි වී තිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය ලබා, අතිරික්තව බැංකු ගිණුමේ ඇති මුදල් ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීමට කටයුතු කරන බව. | අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 සැප්තැම්බර් 30 දිනැති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශයට පත්කළ අංක 1769 දරන පොදු චක්‍රලේඛය ප්‍රකාරව, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට ගොඩනැගිල්ලක සැලැසුම් නිර්මාණය කළ හැක්කේ තනි මහලේ නිවාස සඳහා පමණක් වුවත් සමාලෝචිත වර්ෂය තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් අඳින ලද දෙමහල් ගොඩනැගිලි 03 ක සැලැසුම් සභාව විසින් අනුමත කර තිබුණි. | මහල් දෙකක ගොඩනැගිලි කවුරුන් විසින් අඳින ලැබුවද, සිවිල් ඉංජිනේරුවරයා නිර්දේශ කරනු ලැබුවහොත් පමණක් සභාව විසින් අනුමත කිරීමට අවසරය දී ඇති බව. | චක්‍රෙල්ඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අනවසර ගොඩනැගිලි ඉදිකිරීම් 06ක් සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනුමැතියකින් තොරව ඉදිකරන ගොඩනැගිලි සඳහා දඩගාස්තු අයකිරීමට කටයුතු කරමින් පවතින බව. | අවශ්‍ය නීතියානුකූල කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | ඉඩම් හා ගොඩනැගිලි එකතුව 53ක් සහ මෝටර් රථ 27ක් වර්ෂ කිහිපයකට පෙර තක්සේරු කළ වටිනාකම මත මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරිපත් කර තිබූ නිසා, මූල්‍ය ප්‍රකාශනවල එහි සාධාරණ අගය හෙළිදරව් කර නොතිබුණි. | එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවත්වැඩියා කළහැකි තත්වයේ පවතින වාහන 02ක් අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි තවත් වාහන 03ක් සුදුසු පරිදි අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | වාහන අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි වාහන ඉවත් කිරීමටත් පියවර ගෙන ඇති බව. | වාහන අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි වාහන ඉවත් කිරීමටත් පියවර ගත යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | සැපයුම් සඳහා වෙනමම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට පියවර ගන්නා බව. | සැපයුම් ක්‍රියාවලිය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළයෙල කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්ත** | | |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්යමණ්ඩල ලැයිස්තු ප්‍රකාරව, සභාවේ පැවැති තනතුරු 12ක් සඳහා පුරප්පාඩු 27ක් සහ අතිරික්තව සේවකයින් 12ක් පැවැතුණි. | සභාව විසින් තීරණ ගෙන පුරප්පාඩුව පවතින කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ඉල්ලීම් සිදුකළද, කිසිදු ප්‍රගතියක් අත්නොවූ බව. | පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් පියවර ගතයුතුය. |
| **(ආ) සේවක ණය** | | |
| සභාව විසින් සේවකයින් 02කට ලබාදුන් ආපදා ණය සහ අනෙකුත් ණය රු.130,036ක් පසුගිය වර්ෂ 07ක කාලයක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | මියගිය නිලධාරින්ගේ මාසික විශ්‍රාම වැටුපෙන් අයකරමින් පවතින බව. | හිඟහිටි ණය අය කිරීමට කටයුතු කළයුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15(1) උප වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වී මාස තුනක් ඉකුත් වීමට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුවේ. මේ අනුව, 2023 අප්‍රේල් 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත්, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි කාලයේ මෙවැනි දෝෂ සිදුනොවන පරිදි සැලකිලිමත් වන්නෙමු. එසේම, වාර්ෂික කාර්යසාධන වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පනතේ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයේ ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. |